# ස්වේච්ඡතාව
# (Autism)

ENABLE LANKA
FOUNDATION

I.S.B.N: 978 – 955 – 3632 – 00 - 5

ප්‍රථම මුද්‍රණය - 2017

පරිගණක අක්ෂර සංයෝජනය සහ

පිටු සැකසුම : රුක්ෂාන් ගුණසේන (එනේබ්ල් ලංකා පදනම)

කවර සහ පසුතල චිත්‍ර නිර්මාණය: ජෙෂා කසීම් (එනේබ්ල් ලංකා පදනම)

මෙහි සියලුම හිමිකම් ඇවිරිණි. ගත්කරුවාගේ අවසරය නිසි ලෙස නොලබා, මෙහි එන කිසිවක් කවර මැ සැටියෙන් හෝ උපුටා ගැනුම නීති විරෝධී වේ.

# කෘතගුණ පූර්වකව සටහන් තබන වග නම්...

මොහොතින් මොහොත වෙනස් වන ලෝකයේ, ඒ වෙනස්කම් මතින් එකිනෙකා පරයා පෙරමුණ ගන්නට හැල්මේ දුවන මිනිසාට, තම වර්ගයා අතරම ඉපිද, අනවරත ජීවන අරගලයේ කොටස්කරුවන් වීමට අනේකවිධ අරගල මැදින් යත්න දරන, මනෝසමාජයීය ආබාධිතතා සහිත සුළුතරය සහ ඔවුන්ගේ සමීපතමයන් ගේ කම්කටොලු මගහැරී ඇති මෙවන් යුගයක,

ඔටිසම් (Autism) නමින් කවුරුත් දන්නා ස්වේච්ඡතාව නැමති තත්ත්වය පිළිබඳ සවිස්තරාත්මකව මෙන්ම පහසුවෙන් වැටහෙන අයුරින් තොරතුරු සංග්‍රහයක් නිර්මාණය කළ බ්‍රිතාන්‍ය ජාතික තරුණ නීතිවේදී, ස්වේච්ඡතාව පිළිබඳ බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු උපදේශක **ජොනතන් ඇන්ඩෲස්** තරුණ මහතාත්,

ඒ සඳහා ඇවැසි සහය සහ පිටුබලය ලබාදුන් පොදු රාජ්‍ය මණ්ඩලීය තරුණ කවුන්සලයේ **අයි ඈම් ඒබල් (I'm Able)** ව්‍යාපෘතිය දියත් කළ අන්තර්කරණය සහ ක්‍රියා නියුක්තිය පිළිබඳ කමිටුවේ සියළු දෙනාත්,

සිංහල බසින් එම තොරතුරු ශ්‍රී ලංකාවේ අපට සරිලන අයුරින් සකස් කොට ඉදිරිපත් කිරීමට මූලිකත්වය ගත් කොළඹ විශ්ව විද්‍යාලයේ කායික වෛද්‍ය විද්‍යා අංශයේ කථිකාචාරිනී, **එනේබල් ලංකා පදනමේ** සාමාජිකා වෛද්‍ය දිනේෂනි හෙට්ටිආරච්චි මහත්මියත්,

පරිවර්තනය සඳහා සහාය දැක්වූ සෝමරත්න හේරත් මහතාත්,

එනේබල් ලංකා පදනම වෙනුවෙන් සහ සමස්ථ ශ්‍රී ලාංකික ආබාධ සහිත පුද්ගලයන්ගේ ප්‍රජාව වෙනුවෙන් මෙසේ කෘතවේදීව සිහිපත් කරමු.

ක්‍රිස්ටල් රීඩ් සහ ටී. පී. ජනිත රුක්මාල්
සම නිර්මාතෘ
එනේබල් ලංකා පදනම

## ස්වේච්ඡතාව යනු කුමක් ද ?

''සන්නිවේදනයේ දී සහ අනෙක් පුද්ගලයන් සමග සබඳතා ඇතිකර ගැනීමේ දී සහ භාෂාව සහ වියුක්ත සංකල්ප භාවිතය මහත් සේ අසීරුවෙන් කරන නිසා අනෙක් අයට පෙනෙන, මුල් ළමාවියේ සිටම පවත්නා මානසික තත්ත්වයකි.''

- මනෝ වෛද්‍යවරුන් සඳහා වන රෝග විනිශ්චය පිළිබඳ අත්පොත (DSM IV Diagnostic manual for Psychiatrits)

''පුද්ගලයන් ලෝකය තේරුම් ගන්නා ආකාරය සහ අනෙක් අය සමග කටයුතු කරන ආකාරය කෙරෙහි බලපාන ජීවිතය පුරා පවතින සංවර්ධනාත්මක අබාධිත තත්ත්වයකි. ස්වේච්ඡතාව රෝගයක් හෝ අසනීපයක් නොවන අතර සුවකිරීමට නොහැකි ය. ස්වේච්ඡතාවය ඇති බවක් බොහෝවිට පුද්ගයන්ට දැනෙන්නේ එය ඔවුන්ගේ අනන්‍යතාවය පිළිබඳ මූලික අංගයක් හෙයිනි.''

- ජාතික ස්වේච්ඡතා සංගමය (National Autistic society), එක්සත් රාජධානිය

''මගේ ලෝකය ඔබේ ලෝකය නොවේ. ඔබට නොහැකි දේ ගැන මම ඔත්තු බලමි. එහෙත් ඔබ පැහැදිලිව දකින දෙය මට නොපෙනෙයි. ඔව්, අප එකිනෙකාට වෙනස් වෙමු. එනමුත් ඔබට තිබෙන නිර්මාණශීලිත්වය මගේ මොළයේ නැතැයි හිතන්න එපා''

- නිර්මාණශීලිත්වය (Creativity), 2014

පුළුල්ව ගත්විට ස්වේච්ඡතාව වනාහි ඉන්ද්‍රිය ක්‍රියාවලිය (Sensory Processing) මෙන්ම සමාජීය වර්ධනයට හා චර්යාවට බලපාන තත්ත්වයකි.

අනෙක් අය හා ගත්විට ස්වේච්ඡතාවයෙන් පෙලෙන්නවුන් 'වෙනස්' බවක් පෙන්වීම පොදු ලක්ෂණයකි. පැත්තකට වී සිටීම හෝ සමාජශීලී නමුත් එය පැහැදිලි ලෙස වෙනස් විධියක වීම වැනි විවිධ ආකාර වලින් මෙම වෙනස පෙන්නුම් කරනු ඇත. වඩාත් තදින් ස්වේච්ඡතාවයෙන් පෙලෙන අය පැහැදිලි ලෙස සන්නිවේදනයේ නොයෙදී අනෙක් අයට හඳුනා ගත නොහැකි ලෙස (උදා කථාව, සංඥා හෝ කාය භාෂාව යොදා නොගෙන) සන්නිවේදන කටයුතු කරති.

ස්වේච්ඡතාවයෙන් පෙලෙන බොහෝ අය ස්පර්ෂය, රස, ශබ්දය, පෙනීම, සමබරතාවය වැනි විවිධ සංවේදිතාවයන් කෙරෙහි ඉතා ඉහළ හෝ ඉතා පහළ සංවේදීතාවයක් දක්වති. එකම පුද්ගලයා එක් සංවේදිතාවයකට ඉතා ඉහළ සංවේදිතාවක් පෙන්වන අතර අනෙක්වාට ඉතා පහළ සංවේදිතාවයක් පෙන්වීමට ඉඩ ඇත. එසේම විවිධ සංවේදිතාවයන් ගේ විවිධ මට්ටම් වලදී පමණක් බලපෑමකට ලක් වේ. එය විශේෂ වශයෙන් හඳුනා ගත්තේ නැතිනම් තව තවත් සමාජයීය අසීරුතා ඇතිවීමට පුළුවන.

ස්වේච්ඡතාවයෙන් පෙලෙන සියලු දෙනාම එකිනෙකාට වෙනස් විය හැක. ස්වේච්ඡතාවයෙන් පෙලෙන එක් තැනැත්තෙකු ඔබට හමු වූ විට, ඒ හමුවන්නේ එවැනි එක් පුද්ගලයෙකි (When you've met one autistic person, You've met one autistic person) යනුවෙන් ප්‍රකට කියමනක් ඇත. එකිනෙකා විසින් ස්වේච්ඡතාව වෙනස් වෙනස් ආකාරයෙන් අත්දකින නිසා මේ කියමන හරහා ඔබට යම් යම් නිගමනයන්ට පැමිණිය නොහැක්කේ ය. ඊට හේතුව වන්නේ සමහර පුද්ගලයන්ට පහසුවෙන් හඳුනා ගතහැකි සේ ඉතා තදබල ලෙස බලපාන නමුත් සමහර පුද්ගලයන් තුල එය එතරම් නොපෙනීමයි. කොටින්ම නොපෙනෙන තත්ත්වයක සිටින අය ද ඇත.

ස්වේච්ඡතාව ඇතැයි හඳුනා ගැනීමට අපහසු නිසාම එවැනි පුද්ගලයන්ට රෝග තත්ත්වය බලපා ඇත්තේ සුළු වශයෙන්ය යනුවෙන් තීන්දු කළ නොහැක. සමහර විට එසේ රෝග ලක්ෂණ නොපෙනී තිබීම එතරම් උදව්වක් නොවනු ඇත්තේ 'සාමාන්‍ය' පුද්ගලයන් සේ පෙනෙන පිරිස් රෝගයේ ගති ලක්ෂණ සැඟවීමට මහත් මහන්සියක් ගන්නා නිසා ය.

බොහෝ දෙනා සිතාගෙන සිටිනවාට වඩා ස්වේච්ඡතාව සුලභ රෝග තත්ත්වයකි. මේ වන විට එක්සත් රාජධානියේ පුදගලයන් 88 කින් එක අයෙකු සවේච්ඡාතාවයෙන් පෙලෙන හෝ ස්වේච්ඡතා තත්ත්වයෙන් සිටින්නේ යැයි ද, මෙම සංඛ්‍යාව ඇමරිකා එක්සත් ජනපදයේ 50 කින් එක් අයෙකු ද දකුණු කොරියාවේ පුද්ගලයන් 33 කින් එක් අයෙකු ද වශයෙන් වෙතැයි විශ්වාස කරනු ලැබේ. මධ්‍යස්ථ වශයෙන් ගැණෙන ඇස්තමේන්තුව වන්නේ 100 කට එක් අයෙකු නමුත් එය වුව ද විශාල ප්‍රමාණයකි. මින් අදහස් වන්නේ පොදුරාජ්‍ය මණ්ඩලයේ පුරවැසියන් ගෙන් මිලියන 24 ක් ස්වේච්ඡතා තත්ත්වයෙන් පසුවීමට ඉඩ ඇති අතර, පොදු රාජ්‍ය මණ්ඩලයේ යොවුන් පුරවැසියන් ගෙන් ඉතා අඩු වශයෙන් මිලියන 14.4 ක් වයස අවුරුදු 30 කට වඩා අඩුය.

## මිථ්‍යාව - ස්වේච්ඡතාවය ඇති පුද්ගලයන්ට අනෙක් අය පිළිගැනීමට සහ තේරුම් ගැනීමට හැකියාවක් නැත

ස්වේච්ඡතාව තත්ත්වයේ නොවන අයට ස්වේච්ඡතාවය ඇති පුද්ගලයන් පෙනෙන්නේ 'ආචාරශීලීභාවය' නැති හෝ'නුසුදුසු' චර්යාවන් සහිත අය ලෙස ය.

එහෙත් නියුරෝන විද්‍යාව විසින් සොයා ගෙන ඇති අයුරු අනෙකා පිළිගැනීම සහ තේරුම් ගැනීම පැති දෙකක් ඔස්සේ සිදුවන බවයි. එක් පැත්තකින් අනෙක් අයගේ වචන හා සිරුරු බස ආදියෙන් අනෙක් අයව තේරුම් ගැනීම සහ ඔවුන්ගේ හැසිරීම කලින් ප්‍රකාශ කිරීමට ඇති හැකියාවයි. අනෙක් පැත්තෙන් අනෙක් අයට සත්කාර කිරීම සඳහා ඇති බලවත් උනන්දුවයි. මේ දෙයාකාරයම පාලනය වන්නේ මොලයේ විවිධ කොටස් වලිනි.

ස්වේච්ඡතාවක පුද්ගලයන්ට අනෙක් අයට සත්කාර කිරීම සඳහා ඇති බලවත් උනන්දුව පිළිබඳව අසීරුකම් ඇත. ''මනස පිළිබඳ සිද්ධාන්තය''(Theory of Mind) ලෙස ද මෙය හැඳින්වේ. තමන් අනෙක් අය මෙන් සිතා, ඔවුන් වචන වලින්  හා ඉඟි වලින් අර්ථයන් පහදා දීම මීට සම්බන්ධ වෙයි. එහෙත් මෙය කරන ආකාරය සමහරුන්ට ඉගෙන ගත හැක්කේ විවිධ ප්‍රමාණ වලිනි. ස්වේච්ඡතාවක පුද්ගලයන්ට අයට සත්කාර කිරීම සඳහා ඇති බලවත් උනන්දුව සාමාන්‍ය මට්ටමේ සිට සාමාන්‍ය මට්ටමට ඉහළ නැඹුරුවක් පවතින අතර ඔවුහු අනෙක් අය ගැන ඉතා ගැඹුරින් සැළකිලිමත් වෙති.

මෙම තත්ත්වය බොහෝ විට පුද්ගලික අසීරුතාවයන් ඇති කරයි. ලැබෙන පණිවුඩ වරදවා තේරුම් ගැනීමත්, එහි අර්ථය තේරුම් නොගෙන තරහ ගැනීමත්,  එහි දී අදාල ගැටලුව විසඳ ගන්නා ආකාරය නොදැනීමත් ප්‍රථිපලය වෙයි. ඒ අනුව උනන්දුවකින් තොරව නොසැළකිලිමත්ව මෙන්ම කතාබහින් ඈත් වූ ස්වභාවයක් පෙන්වුව ද සැබෑ තත්ත්වය ඊට සහමුලින් විරුද්ධ එකකි.

## මිථ්‍යාව - අනෙක් අය පිළිගැනීමට සහ තේරුම් ගැනීමට හැකියාවක් නැතිවීමේ තත්ත්වය ඒකපාක්ෂික වේ

ස්වේච්ඡතාවයෙන් පෙලෙන පුද්ගලයන්ට පමණක් අනෙක් අය තේරුම් ගැනීම අපහසු බව බොහෝ විට සිතතත්, අන්‍යයන්ට ස්වේච්ඡතාවයෙන් පෙලෙන අයව තේරුම් ගැනීම අපහසු බව සිතනු නොලැබේ. එහෙත් මේ සම්බන්ධයෙන් වැදගත් කමක් සහිත එක් තර්කයක් වන්නේ මෙම දෙපාර්ශ්වයටම එකිනෙකා තේරුම් ගැනීමේ අමාරුවක් ඇති බවයි. එයට හේතුව ලෙස පෙන්වා දෙන්නේ එක් පාර්ශ්වයක් විසින් අනෙක් පාර්ශ්වයට තේරුම් ගත නොහැකි ආකාරයෙන් දෙපාර්ශ්වය විසින්ම සන්නිවේදනයේ යෙදීමයි.

උදාරහණයක් ලෙස, ස්වේච්ඡතාවය **නොමැති අය** ස්වේච්ඡතාවය **ඇති අයගේ** සිරුරු බස කියවා තේරුම් ගන්නා ආකාරයට එහි සැබෑ අදහස මතු නොවේ. එනිසා එක් පාර්ශ්වයක් විසින් අනෙකා තේරුම් ගැනීමට දෙපාර්ශ්වයම උත්සාහ ගැනීම අවශ්‍ය වේ.



ENABLE LANKA FOUNDATION

**මිථ්‍යාව - අඩු වැඩි වශයෙන් ස්වේච්ඡතාවයේ එක එක මට්ටම්වල සිටින සෑම කෙනෙකුටම එක්කෝ ඇස්පර්ගර් සහලක්ෂණය (Asperger Syndrome) ඇත, නැතිනම් ''සම්භාව්‍ය ස්වේච්ඡතාවය'' (Classic Autism) ඇත**

යම් අයෙකුට ස්වේච්ඡතාව පවතින්නේ ඇස්පර්ගර් සහලක්ෂණය (Asperger Syndrome) සහ සම්භාව්‍ය සහලක්ෂණය (Classic Autism) යන තත්ත්වයන් දෙක අතර තැනක ය. මින් ඇස්පර්ගර් සහලක්ෂණය ස්වේච්ඡතාවයේ ඉහළ මට්ටමින් ක්‍රියාත්මක වෙයි. ඇස්පර්ගර් සහලක්ෂණය හා සම්භාව්‍ය සහලක්ෂණය අතර ස්වේච්ඡතාව අඩු වැඩි වශයෙන් පැවතීම ස්වේච්ඡතා පරාසය (Autism Spectrum) ලෙස හැඳින්වේ. මෙම පරාසයට ඉගෙනීමේ හැකියාව නැති අය සහ පහළ බුද්ධි ඵලයක් තිබෙන අය ද ඇතුලත් වේ. කෙසේ වෙතත් මෙම පරාසය සම්බන්ධව වෙනත් රෝග විනිශ්චයන් ද ඇත. ස්වේච්ඡතාව ලෙස සැළකීමට නොහැකි නමුත් ඇස්පර්ගර් හෝ ස්වේච්ඡතා ගණයන්ට ඇතුල් කළ නොහැකි පුද්ගලයන් ආවරණය කෙරෙන ආබාධයන් මීට ඇතුලත් වේ.

## මිථ්‍යාව - ස්වයං උත්තේජන චර්යාව (Stimming) සහ කෙරෙන කතා බහට අදාල නොවන යම් වාක්‍ය ඛණ්ඩයක් නැවත නැවතත් භාවිතා කිරීම (Scripting) නුසුදුසු ය

ස්වේච්ඡතාවය ඇති පුද්ගලයන් නිතර පය බිම ගැසීම, අත් දෙපසට වැනීම නැතහොත් ඉහළ පහළ වැනීම හෝ යම්දෙයක් තදින් අල්ලා ගැනීම /අතගෑම ආදී නැවත නැවතත් කෙරෙන ශරීර චලනයන් හි යෙදෙති. මේවා ස්වයං උත්තේජන චර්යාවන් ලෙස හැඳින්වේ. කෙරෙන කතා බහට අදාල නොවන යම් වාක්‍ය ඛණ්ඩයක් නැවත නැවතත් භාවිතා කිරීම විශේෂ පරිසරයක් වෙනුවෙන් භාෂාව යොදා ගැනීම ලෙස හැඳින් වේ. බොහෝ විට නොදැනුවත්වම අනෙක් පුද්ගලයන් අපහසුවට පත් කෙරෙන නිසා ස්වයං උත්තේජන චර්යාවත්, විශේෂ ආකාරයකින් භාෂාව යොදා ගැනීමත් නුසුදුසු බව බොහෝවිට සැලකේ.

කෙසේ වෙතත් මේවා ස්වේච්ඡතාව ඇති පුද්ගලයන් විසින් තමාම තමන්ව සන්සුන් කිරීම සහ උත්තේජනය කිරීම පිණිස යොදාගන්නා ක්‍රම වෙයි. ඔවුන්ගේ හැඟීම් දැනීම් වල වෙනස්කම් නිසා මෙම ක්‍රියාවන් අවශ්‍ය වෙයි. මෙම ක්‍රියාවන්ට ඉඩ නොදුනහොත්, ආතතිය මුදාහැරීමක් සිදුනොවන නිසා ඔවුන්ගේ මානසික හා චිත්තවේගී සුභසාධනයට හානිවන අතර, මහත් වූ ආතතියක් ද ඇති කරයි.

ස්වේච්ඡතාවයෙන් පෙලෙන පුද්ගලයන්ට එසේ කිරීමට ඉඩ හැරීම ඉතාමත් සුදුසු ය. එසේ නැතහොත් සමහර පරිසරයන් හි දී අවශ්‍ය වුවහොත් අනෙක් අයගේ අවධානයට යොමු නොවන සේ එසේ හැසිරෙන ආකාරය ඔවුන්ට ඉගැන්විය යුතු ය.

## මිථ්‍යාව - ස්වේච්ඡතාවය ඇති පුද්ගලයන්ට සිය කල්පනාව මෙහෙයවා කටයුතු කිරීම හෙවත් චිත්තෝත්පාදක (Imaginative) වීමට සහ නිර්මාණාත්මක (Creative) වීමට නොහැකිය

MBE නාමධාරී ස්ටීවන් විල්ට්ෂයර් වැනි ස්වේච්ඡතාවය ඇති කලාශිල්පීන් මාධ්‍ය වල පෙනී සිටිනු දැකීම නිසා තරුණ තරුණියන් අතර මෙය එතරම් සුලභ මිථ්‍යාවක් නොවූවත්, සමාජයේ සෙසු කොටස් අතර සුලභ මිථ්‍යාවක් ලෙස තවමත් පවතී. මීට හේතුව1980 ගණන් වල යොදා ගත් ප්‍රසිද්ධ ව්‍යාධිවේදාත්මක මෙවලමක් වන ''හානි ත්‍රිකය'' (Triad of Impairments) විසින් චිත්තෝත්පාදන හානිවීම ස්වේච්ඡතාවයේ ගති ලක්ෂණයක් ලෙස ලැයිස්තුගත කර තිබීමයි.

ඇත්ත වශයෙන්ම මින් අදහස් වන්නේ සමාජයීය චිත්තෝත්පාදනය හෙවත් අනෙක් අයගේ චර්යාව නිවැරදිව කලින් කීමේ හැකියාවයි.

අදාල කරුණක් වෙන් කර ගැනීමේ විශාල චිත්තෝත්පාදක හැකියාවක් ස්වේච්ඡතාව සහිත පුද්ගලයන්ට ඇති අතර නියමිත වචනමාලාවක් යොදාගෙන සිදුවන බොහෝ කතා බහ අවස්ථාවන්ට ගැලපෙන සේ ඔවුන්ගේ නිර්මාණශීලිත්වය සකසා ගැනීමට ඔවුන්ට නොහැකි ය. ඒ නිසා සිය සමාජීය චිත්තෝත්පාදනය ඉතා නිවැරදිව ගොඩ නගා ගැනීම සමහර විට ඔවුන්ට අසීරු වේ.

මෑත අවුරුදු වල දී වඩ වඩාත් නිර්මාණාත්මක කර්මාන්ත වලට ස්වේච්ඡතාවය සහිත පුද්ගලයන් වැඩි වැඩියෙන් බඳවා ගැනීම ආරම්භ කර තිබේ. මොවුන් උසස් ගත්කතුවරුන්, චිත්‍ර ශල්පීන්, ගෘහ නිර්මාණ ශිල්පීන්, කාව්‍යක්කාරයන් වෙති. මින් බොහෝ දෙනා ඉතාමත් නිර්මාණශීලී වෙති.


ENABLE LANKA FOUNDATION
SUPPORT AUTISM

## මිථ්‍යාව - ස්වේච්ඡතාවක පුද්ගලයන් සුදුසුවන්නේ තොරතුරු දත්ත තාක්ෂණ රැකියා සඳහා පමණි

තොරතුරු තාක්ෂණ හා දත්ත හැකියාවන් කෙරෙහි බොහෝ ස්වේච්ඡතාවක පුද්ගලයන් උනන්දු වෙනවා මෙන්ම කුසලතාවයන් දක්වති. එහෙත් ඔවුන් සියලුම දෙනා මෙම ක්ෂේත්‍රයට උනන්දුවක් දක්වන අය හෝ කුසලතාව ඇති අය නොවෙති.

ස්වේච්ඡතාවය ඇති වෛද්‍යවරුන්, ගුරුවරු, විද්‍යාවන් මෙන්ම මානව ශාස්ත්‍ර අධ්‍යයන කටයුතු වල යෙදෙන විද්වතුන් ද වෙති. එසේම නීතිඥ හා අධිනීතිඥ කටයුතු වල යෙදෙන්නෝ, බැංකු කරුවෝ, උපදේශකයෝ සහ ඉහළ මට්ටමින් ක්‍රියාත්මක ස්වේච්ඡතාවය ඇති හිටපු ඕස්ට්‍රේලියානු නියෝජ්‍ය අගමැති ටොම් ෆිෂර් වැනි පොදුරාජ්‍ය මණ්ඩලීය දේශපාලනඥයෝ ද වෙති. ස්වේච්ඡතාවක පුස්තකාලයාධිපතිවරුන්, මුදල් අයකැමියන්, සුපිරි වෙළඳසැල් සේවකයන් සහ තවත් බොහෝ තැනැත්තන් ද මොවුන් අතර වෙයි.

ස්වේච්ඡතාවයෙන් පෙලෙන පුද්ගලයන් අති බහුතරයකට වැඩ කිරීමේ අවශ්‍යතාවය තිබුණ ද, බොහෝ දෙනා සේවා වියුක්ත වෙති. සංඛ්‍යාලේඛන වලට අනුව පූර්ණ කාලීනව සේවා නියුක්තියේ යෙදෙනෙ ස්වේච්ඡතාවක වැඩිහිටියන්ගේ ප්‍රමාණය 15-35% අතර වෙයි. රැකියාවේ යෙදෙන විට සේවායෝජකයන්ට වාසිදායක විය හැකි කුසලතා බොහෝ දෙනාට ඇතත් සම්මුඛ පරීක්ෂණ වලදී අදහස් ප්‍රකාශ කිරීමේ හැකියාව සම්බන්ධයෙන්ද දුෂ්කරතාවයන්ට මුහුණ පාන හෙයින් ඔවුන්ට එම අවස්ථා අහිමි වේ.

## මිථ්‍යාව - ස්වේච්ඡතාවය මානසික සෞඛ්‍ය තත්ත්වයකි.

ස්වේච්ඡතාවය වනාහි වර්ධනය පිළිබඳ තත්ත්වයකි. (එය ස්නායුවේදීය (neurological) හෝ ස්නායු අපසාරී (neuro divergent) තත්ත්වයන්/වෙනස්කම් ලෙස ද හැඳින්වේ). එය උපතේ සිට පවත්නා අතර මොළය ක්‍රියාකරන ආකාරය හා ඒකාබද්ධව පවතින්නකි. අසනීපයක් නොවේ. මානසික රෝගාබාධ වල දී මෙන් වරින් වර ක්‍රියාකාරී වන කාලයක් ඊට නැත. පුද්ගලයන් ස්වේච්ඡතාවක වීමට හෝ නොවීමට හැකි අතර සමහරුන්ට ප්‍රතිකාර අවශ්‍ය වී ප්‍රතිකාර ගන්නවා විය හැක. සමහරුන්ට එසේ අවශ්‍ය නොවේ. 'සුවකිරීමේ හැකියාවක් තිබුණ ද' ස්වේච්ඡතාවයෙන් පෙලෙන පුද්ගලයන් අති බහුතරයකට එසේ සුවවීමේ අවශ්‍යතාවයක් නැත. ඔවුන් ගේ සාර්ථකත්වයට බලපාන සැබෑ බාධක පැමිණෙන්නේ සමාජය ස්වේච්ඡතාවය දෙස බලන ආකාරය නිසා මිස තමන්ට ඇති ස්වේච්ඡතාවය නිසා නොවන බව ඔවුන්ට බොහෝ විට දැනේ.

## මිථ්‍යාව - ස්වේච්ඡතාවය ඇති පුද්ගලයන්ට මානසික සෞඛ්‍ය තත්ත්වයන් ඇතිවිය නොහැක

කෙසේ වෙතත් සමාජය විසින් සෘණාත්මකව සැලකීම හේතු කොට ගෙන ස්වේච්ඡතාවය ඇති පුද්ගලයන් විෂාදය සහ කාංසාව වැන මානසික තත්ත්වයන්ට ගොදුරු විය හැකි බව ඇත්තකි. විෂාදය හා කාංසාව යන තත්ත්වයන් දෙකින් එකක් හඳුනා ගත හැකි ලකුණු පෙන්වා සිටින්නේ ස්වේච්ඡතාවය ඇති දරුවන්ගෙන් 70% ක සංඛ්‍යාවක් වන අතර, ඒ දෙකම හඳුනා ගත හැකි ලකුණු පෙන්වා සිටින්නේ 40%ක සංඛ්‍යාවකි. එසේ වුව ද, මෙම ලකුණු වෘත්තිකයන් විසින් දරුවන්ගේ ස්වේච්ඡතාවයේ ලක්ෂණ වලින් කොටසක් ලෙස වැරදියට සිතීම නිසා හෝ එම දරුවන්ට රෝග පිළිබඳ ලේබල බොහෝ ගණනක් දීමට අවශ්‍ය නොවන නිසා හෝ මෙම දරුවන් රෝග විනිශ්චයකට ලක් නොවේ. මින් අදහස් වන්නේ දරුවන් ගෙන් බොහෝ දෙනෙකුට ඔවුන්ගේ මානසික සෞඛ්‍ය ගැටලු සඳහා උදව් නොලැබී යාම ය.

ස්වේච්ඡතාවය සහිත පුද්ගලයන් මුහුණ පාන මානසික සෞඛ්‍යය දුර්වලවීම සම්බන්ධ අවදානම, එක්සත් රාජධානියේ මානසික සෞඛ්‍ය පුණ්‍යායතනයක් වන Mind සංවිධානය විසින් නිරාකරණය කර ඇත. මේ සඳහා විශිෂ්ඨ පරිචයන් බෙදා හදා ගැනීම පිණිස 2015 වසරේ දී මෙවලම් ගොන්නක් දියත් කිරීමෙන් ද, ස්වේච්ඡතාවක පුද්ගයන්ට මානසික සෞඛ්‍ය සේවාවන් සඳහා පිවිසීම සහතික කරනු පිණිස ක්‍රියාත්මක Ambitious about Autism වැනි සංවිධාන සමග සහයෝගයෙන් ක්‍රියාත්මක වීමෙන් ද Mind සංවිධානය කටයුතු කර ඇත.

## මිථ්‍යාව - ස්වේච්ඡතාවය සමාජ තත්ත්වයක් පමණි

ඔවුන්ගේ සංවේදනයන් හරහා ලෝකය පිළිබඳව අවබෝධ කරගන්නා ආකාරය කෙරෙහි ද ස්වේච්ඡතාවය බලපායි. ඉන් ඔවුන්ට ශබ්දය, ස්පර්ෂය, ආඝ්‍රාණය, රසය, ශ්‍රවණය, උණුසුම, වේදනාව හෝ සමබරතාවය ආදී විවිධ හැඟීම් දැනීම් (සංවේදන) වලට අධිසංවේදිතාවයක් (ප්‍රමාණය ඉක්ම වූ සංවේදිතාවය) හෝ අවසංවේදීතාවයක් (ප්‍රමාණවත් නොවන සංවේදිතාවය) ඇති විය හැක. එකම පුද්ගලයා එක් සංවේදනයකට අධිසංවේදිතාවයක් දක්වනු ඇති අතර තවත් සංවේදනයකට අවසංවේදිතාවයක් දක්වනු ඇත. (බොහේ විට එය එසේම වේ.)

අනෙක් අයට වඩා පැහැදිලිවම වෙනස් ලෙස ඔවුන් යම් යම් තත්ත්වයන් අත්දකින නිසා කෙනෙකුට සැප පහසු සේ දැනෙන ශබ්දය, ආලෝකය, උණුසුම ආදිය ස්වේච්ඡතාවක අයෙකුට ඝෝෂාකාරී, දීප්තිමත්, තද රස්නය සහිත බවක් දක්වයි. ස්වේච්ඡතාවක අයෙකුට ඉහත හේතු නිසා ආතතියක් ඇති කරවන අතර සෙසු අය විසින් මෙම ත්ත්තවය තේරුම් ගැනීමට ඇති ඉඩ ඉතා අඩු ය. ආතතිය හේතු කොටගෙන සවේච්ඡතාවක පුද්ගලයන් ගේ හැසිරීම අමුතු හෝ ගොරෝසු නොහික්මුණු ආකාරයක් ගනු ඇති අතර, එම අවස්ථාවේ දී අනෙක් අය ද ඒ ආකාරයටම ක්‍රියාත්මක වන්නට ඉඩ ඇත.

## මිථ්‍යාව - ස්වේච්ඡතාවක පුද්ගලයන් සියලු දෙනාම විශේෂ කුසලතාවයක් ඇති ප්‍රාඥයන්ය

ස්වේච්ඡතාවක පුද්ගලයන්ට විශේෂ ලැදියාවක් තිබිය හැකි බව සත්‍ය ය. එසේ හෙයින් එම ලැදියාවන් අධ්‍යයනය සඳහා කාලය කැප කරන නිසා ඒ ගැන බොහෝ කරුණු දන්නා නමුත් එය ප්‍රාඥයෙකු වීමට සමාන වන්නේ නැත. ඊට හේතුව වන්නේ බොහෝ ස්වේච්ඡතාවක පුද්ගලයන්ට එක් විශේෂ ලැදියාවක් පමණක් නොව ලැදියාවන් රාශියක් තිබීමයි. ඇස්තමේන්තු වලට අනුව ස්වේච්ඡතාවක පුද්ගලයන් අතුරින් සැබෑ ප්‍රාඥයන් වන්නේ 0.05% පමණ කි. ඔවුන් ඉන්නේ ඉතා වෙනස් තත්ත්වයන් දෙකක ය.



මිතුරන්ට හා සේවා යෝජකයන්ට ලෙන්ගතු වීම, විස්තර සඳහා දැඩි අවධානයක් තිබීම, කලට වේලාවට වැඩ කිරීම, වැඩට කැපවීම හා ඒ ඒ ගැටලු දෙස අමුතු ආකාරයකින් බැලීම ආදී විශේෂ ප්‍රතිභාවයන් සවේච්ඡතාවක පුද්ගලයන්ට නැතැයි මින් අදහස් නොකෙරේ.


ENABLE LANKA FOUNDATION
SUPPORT AUTISM

## මිථ්‍යාව - ගැහැණු දරුවන් හා වැඩිහිටි කාන්තාවන්ට ස්වේච්ඡතාවය ඇති නොවේ, එසේ නැතහොත් ඊට ගොදුරුවන්නේ ඉතා සුළු පිරිසකි

ගැහැණු දරුවන් ස්වේච්ඡතාවක විය නොහැකි බවත්, ස්වේච්ඡතාවක පරාසය පුරුෂයන්ට බලපාන තත්ත්වයක් බවත් කලකට පෙර දී විශ්වාස කරන ලදී. ඉන්පසු කාන්තාවන් හා ගැහැණු දරුවන්ට ද මෙම තත්ත්වය ඇති බව රෝග විනිශ්චයේ දී හෙලිවිය. එහෙත් පිරිමින්ට තිබූ අනුපාතයට වඩා අඩුවෙනි. නමුත් එසේ රෝග විනිශ්චයට ලක් වූ අය දැඩි සේ ස්වේච්ඡතාවයේ බලපෑමට හසුව තිබූ බව ද හඳුනා ගන්නා ලදී. පුරුෂ මොළයේ එක්තරා සීමාන්තික ආකාරයක් ලෙස ස්වේච්ඡතාවය සම්බන්ධ අදහසක් පල වී තිබිනි.

කෙසේ වෙතත් රෝග විනිශ්චයට අනුව දැන් කාන්තාවන්ට හා ගැහැණු දරුවන්ට සවේච්ඡතාවය ඇතැයි වැඩ වැඩියෙන් හෙලි වී ඇති හෙයින්, සාර්ථක අධ්‍යයන මණ්ඩල සාමාජිකාවන්, මාධ්‍යවේදීන්, සහ සිවිල් සේවිකාවන් ඇතුලු කාන්තාවන් බොහෝ දෙනෙක් ඒ ගැන විවෘතව ප්‍රකාශ කරති. ස්වේච්ඡතාවය පුරුෂයන් හා ගැටගැසෙන ස්වභාවය නිසා ගැහැණු දරුවන්ගේ ගේ හෝ වැඩිහිටි කාන්තාවන්ගේ හෝ (පිරිමින්ගේ හෝ) නොව පිරිමි දරුවන්ගේ චර්යාවන් නිරීක්ෂණය කිරීමට මනෝ විද්‍යාඥයන්ට උගන්වන හෙයින් ස්වේච්ඡතාවක කාන්තාවන් හා ගැහැණු දරුවන් අවධානයෙන් ගිලිහෙන බව විශ්වාස කෙරේ.

සෙසු ප්‍රජාව සමග මුසුවීම උදෙසා ඉතා කුඩා වයසකදීම තම ගති ලක්ෂණ සැඟවීමෙහි ලා ස්වේච්ඡතාවය සහිත කාන්තාවන් නැඹුරු වෙති. විශේෂයෙන් ස්වේච්ඡතාවය අඩු හෝ වඩා නොපෙනෙන කාන්තාවන් පසු කාලයේ දී ඔවුන් ගේ සැබෑ අනන්‍යතාවය නිරතුරුව ආවරණය කර ගැනීම වෙහෙස කර තත්ත්වයට පත්වන තුරු රෝග විනිශ්චයට ලක් නොවේ.

ස්වේච්ඡතාවයේ විවිධ ආකාරයන් පිළිබඳ විෂයයෙහි දී ස්වේච්ඡතාවය සහිත පුද්ගලයන් ස්ත්‍රී සමලිංගික, පුරුෂ සමලිංගික, උභය ලිංගික හෝ සංක්‍රාන්ති ලිංගික (LGBT) විය හැක. විශාල සංඛ්‍යාවක් සංක්‍රාන්ති ලිංගික පුද්ගලයන්ය. සුළුතර ජනවාර්ගික කණ්ඩායම් හා වයස්ගත පුද්ගලයන්ට ස්වේච්ඡතාවය ඇතැයි රෝග විනිශ්චයෙන් හඳුනා ගෙන ඇත්තේ සුළු පිරිසක් වුව ද, ස්වේච්ඡතාවය ඇත්තවුන් ඕනෑම ජාතියකට හෝ වයසකට අයත් විය හැක. ඒ ඒ කොටස්වල අනුපාතයේ සැබෑ වෙනසකට වඩා ප්‍රජාවන් තුල ඇති දැනුවත්භාවයේ අඩු ගතිය නිසා මෙසේ වීමට වැඩි ඉඩක් ඇත. රෝද පුටු භාවිතය හෝ dysforaxia හෝ dyslexia (දුෂ්ඨත්වය) වැනි අනෙක් ආබාධිත තත්ත්වයන් ද ස්වේච්ඡතාවය සහිත පුද්ගලයන්ට තිබිය හැක. (Dysforaxia වනාහි කුඩා අවදියේදී සම්බන්ධිකරණය හා චලනය අවශ්‍ය කරන ක්‍රියාකාරකම් වලදී අසීරුතාවයන් ඇති කරන වර්ධනය සම්බන්ධ ආබාධයකි. Dyslexia යනුවෙන් හැඳින්වෙන්නේ වචන අංධතාවය- නිවැරදිව හා චතුර ලෙස කියවීම පිළිබඳ විශේෂිත ඉගෙනුම් ආබාධයකි).

## මිථ්‍යාව - සේවා ස්ථානයෙහි උපකරණ ආදිය භාවිතයේ දී ගැලපීම් සකස් කර ගැනීමේ හැකියාවන් ස්වේච්ඡතාවක පුද්ගලයන්ට ලබාගත නොහැකිය

එක්සත් රාජධානියෙහි දී සමානාත්මතාවය පිළිබඳ පනත යටතේ ස්වේච්ඡතාවය ආබාධයක් ලෙස සැලකේ. ස්වේච්ඡතා පරාසයේ සිටින පුද්ගයන්ට සිය සම්පූර්ණ විභවයෙන් වැඩ කිරීමට ඉඩ ලබා දෙනු පිණිස සාධාරණ ගැලපීම් ඇති කිරීම සඳහා සේවා යෝජකයන් විසින් කලින් ඉටුකිරීමට අපේක්ෂිත යුතුකමක් ඇති බව මින් ප්‍රකාශ වෙයි.

ශබ්දයට අධි සංවේදි බවක් ඇතිනම් ඉස්බනු (Headphones) සැපයීම, ශබ්ද වලින් බැහැර තැනක මේසයක් ලබාදීම, අදාල උපදෙස් ඔවුනට පැහැදිලිව විස්තර කර දීම, අන්තර්ජාල ගත පරීක්ෂණවලට මුහුණ දිය යුතු නම් සුදුසු වෙනස් කම් කිරීම, විවිධ රැකියාවල භූමිකාවන් මිශ්‍රව ඒ ඒ සේවකයන්ට පවරා තිබීම මඟින් දුර්වලකම් මග හැර ගෙන ඔවුන්ගේ සියලුම කුසලතා භාවිතයට ගත හැකි රැකියාවක නිරත වීමට අවස්ථාව සැලසේ. සේවා ස්ථානයේ සංස්කෘතිය ගැනත්, අදාල සුළු සීරුමාරු කිරීම් ගැනත් වැටහීමක් ඇති කිරීම සඳහාත්, බොහෝ කර්මාන්ත ආයතන විසින් ස්වේච්ඡතාවය පිළිබඳව දැනුවත්භාවය ඇති කිරීමේ සැසි පවත්වනු ලැබේ.

මෙම සීරුමාරු කිරීම් හා ගැලපීම් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් ඔවුන්ගේ යුතුකම ගැන බොහෝ සේවා යෝජකයන්ට දැනුවත්භාවයක් නැතිබව ඇත්ත ය. එක්සත් රාජධානියෙන් පිට රටවල ආබාධිත පුද්ගලයන්ට ගැලපීම් හා සහාය ලබාගැනීම පිණිස උදව් දීමට ව්‍යවස්ථා සම්පාදනයක් නොමැති වුවහොත් බොහෝ ස්වේච්ඡතාව සහිත පුද්ගලයන් අසීරුතාවයන්ට මුහුණ පානු ඇත.

## ස්වේච්ඡතාවය සහ අඩු නියෝජනයක් සහිත කණ්ඩායම්

ඉහතින් සාකච්ඡා කළ පරිදි, හඳුනාගත් සහ සහාය නොලබන අය අතර ස්වේච්ඡතාවක කාන්තාවන් හා ළමුන් වඩාත්ම කැපී පෙනෙන කණ්ඩායම වෙයි. එනමුත් දැනුවත්භාවය පහළ මට්ටමක පවතින වෙනත් ප්‍රජාවන් උදාහරණයක් ලෙස, දියුණු පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල (ඕස්ට්‍රේලියාව, කැනඩාව, නවසීලන්තය සහ එක්සත් රාජධානිය) සුළු ජන ප්‍රජාවන් හි ස්වේච්ඡතාවය විනිශ්චය කිරීමේ අනුපාතය සාමාන්‍ය මට්ටමට වඩා පහළ මට්ටමක පවතී. මොනයම් හෝ ස්වභාවික වෙනසක් නිසා මෙසේ වූවා දැයි ප්‍රකාශ කරන කෙනෙකු ද නැත. කෙසේ නමුත් ස්වේච්ඡතාවය පිළිබඳ අධ්‍යයනයට ඇති බාධා නිසා ඒ ගැන ප්‍රජාවන් අතර ඇති පහළ මට්ටමේ දැනුවත්භාවය මීට හේතුවක් සේ සිතිය හැක.

බොහෝ අධ්‍යයන වලින් හෙලි වී ඇත්තේ පහළ සමාජ ආර්ථික ප්‍රජාවන් තුල ද දැඅනුවත්භාවය අඩු බවයි. පුද්ගලික අංශය හරහා රෝග විනිශ්චය සඳහා ඔවුන්ට වියදම් කිරීමට නොහැකි නිසාත්, මහජන සෞඛ්‍ය අංශයේ සේවාව ලබාගැනීමට දිගු කලක් නැවතී බලා සිටීමට සිදුව ඇති නිසා ත්, ඔවුන් ගේ ස්වේච්ඡතා රෝග විනිශ්චය අනුපාතය ද පහළ මටටමක පවතී. මෙම තත්ත්වයන්ට මුහුණ දීමට සිදුවන නිසා ඔවුන් නිතැතින්ම රෝග විනිශ්චය කටයුතු අත්හැර දමති. එසේ නැතිව නොපසුබටව ක්‍රියාත්මක නොවුවහොත්, ඔවුන්ට හෝ ඔවුන් ගේ දරුවන්ට බොහෝ කල් ගතවීමෙන් පසු රෝග විනිශ්චය ලැබේ.

ස්වේච්ඡතාවය පිළිබඳ දැනුම කාලයත් සමග, විශේෂයෙන් පසුගිය දශක තුන තිස්සේ වර්ධනය වී ඇත. දියුණු රටවල වැඩිහිටි පුද්ගලයන්, විශේෂයෙන් වයස අවු. 50 ඉක්මවූවන්, හැදී වැඩී ඇත්තේ ස්වේච්ඡතාවය පිළිබඳ දැනුවත්භාවයත්, රෝග විනිශ්චය කිරීමත් අද පවතින්නාක් මෙන් පැතිර තිබූ කාලයක නොවේ. ඉතා හොඳින් පෙනෙන තත්ත්වයන් සහිත වූවන් පමණක් රෝග විනිශ්චයට ලක් විය. එසේ හෙයින් ස්වේච්ඡතාවය සඳහා දැන් යොදා ඇති නිර්ණායකයන් එවක සම්පූර්ණ කර සිටි වයස්ගත පුද්ගලයන් ගෙන් බොහෝ දෙනා ස්වේච්ඡතාවය සම්බන්ධ රෝග විනිශ්චයකට හසු නොවන්නට ඇති අතර ස්වේච්ඡතාවය ඇතැයි හඳුනා නොගත් නමුත් ස්වේච්ඡතාවය නිසා ඇතිවන අසීරුකම් ඔවුනට තවමත් තිබෙනවා වෙන්නට ඇත. මෙම අසීරුකම් ළමා වියේ දී රෝග විනිශ්චය කරන ලද අයට වඩා වැඩිහිටි අය කෙරෙන් ප්‍රකට වේ. හේතුව වන්නේ තත්ත්වය පාලනය කිරීමේ මැදිහත්වීම් සිදු නොවී තිබීම යි.

ENABLE LANKA FOUNDATION
SUPPORT AUTISM

## මිථ්‍යාව - සෑම සංස්කෘතියකදීම ස්වේච්ඡතාවය ගැන සැළකිලිමත් වන්නේ එකම ආකාරයකටය

විවිධ සංස්කෘතීන්හි දී විවිධ ගති ලක්ෂණ /චර්යාවන් විවිධ බලපෑම් ඇති කරයි. උදාහරණ ලෙස ජපානයේ සහ බොහෝ අප්‍රිකානු රටවල ද සමාජයීය වශයෙන් උසස් තත්ත්වයක සිටින්නවුන් සමග කථා කරන විට ඇස් ගැටුම (Eye Contact) මග හැරීම ශිෂ්ඨ සම්පන්න ලෙස සළකනු ලැබේ. බටහිර ලෝකයේ දී එසේ මගහැරීම අගෞරවයක් ලෙසත්, ස්වේච්ඡතාවය සමග තදින් බැඳුන ගති ලක්ෂණයක් ලෙසත් සැළකෙනු ඇත.

ස්වේච්ඡතාවය සම්බන්ධ වැටහීම/අධ්‍යාපනය අඩු බොහෝ සංස්කෘතීන්හි රෝග විනිශ්චය සම්බන්ධයෙන් බලවත් හංවඩු ගැසීමක් පවතී. ස්වේච්ඡතාවය රෝගයක් ලෙස හෝ මානසික සෞඛ්‍ය පිළිබඳ කාරණයක් ලෙස හෝ එසේත් නැතිනම් සදාචාරාත්මක දෝෂයක් සේ වරදවා සැළකීමට පුළුවන. මෙම සංස්කෘතීන්හි දී පුද්ගලයන්ට ස්වේච්ඡතාවය සැගවීමේ හැකියාව ඇති වීම නිසා රෝග විනිශ්චයක් කරා යාමට හෝ ස්වේච්ඡතාව ගැන විවෘතව කථා කිරීමට අදිමදි කරති.

පොදු රාජ්‍ය මණ්ඩලය සංස්කෘතික වශයෙන් ඉතා වෙනස් ජාතීන්ගෙන් සැදී ඇති හෙයින් ස්වේච්ඡතාවය ගැන පොදු රාජ්‍ය මණ්ඩලයේ සෑම තැනකම එකම මතයක් තිබීමට ඉඩක් නැති බව මතක තබා ගැනීම වැදගත් වේ.

මෙහි බොහෝ ප්‍රායෝගික වෙනස් කම් ඇත :

- දියුණු පොදුරාජ්‍ය මණ්ඩලීය රටවල ස්වේච්ඡතාවය හඳුනා ගැනීම සාපේක්ෂ වශයෙන් ඉහළ අනුපාතයක් ගනී. ස්වේච්ඡතාව සහිත පුද්ගලයන් සාපේක්ෂ වශයෙන් ඉහළ සංඛ්‍යාවක් උසස් අධ්‍යාපනයකට ඇතුල් වීමත් සිදුවෙන නමුත් සේවා ස්ථානවල සේවයට බැඳීම පිළිබඳ සංඛ්‍යානයන් පහළ මට්ටමක පවතී. පූර්ණ කාලීන වැටුප් ලබන සේවා නියුක්තිය 15 - 30% අතර වේ.

- රටවල් ඇතුලත වුව ද වෙනස්කම් තිබේ. කෙසේ වෙතත්, කැනඩාව හා එක්සත් රාජධානිය PPD-NOS (Pervasive Developmental Disorder-Not Otherwise Specified) තත්ත්වය ස්වේච්ඡතාවක පරාසයට ඇතුලත් බව පිළිගනී. එහෙත් ඔස්ට්‍රේලියාව හා නවසීලන්තය පිළිගන්නේ නැත.

- දියුණු වෙමින් පවත්නා පොදුරාජ්‍ය මණ්ඩලීය රටවල ස්වේච්ඡතාවයෙන් පෙළෙන පුද්ගලයන් සංඛ්‍යාව, අනෙක් දියුණු රටවල ස්වේච්ඡතාවයෙන් පෙළෙන පුද්ගලයන් සංඛ්‍යාවට සමාන වෙතත් රෝග විනිශ්චයට ඉදිරිපත්වීම පිළිබඳ දත්තයන් සපයාගැනීම අපහසු අතර උසස් අධ්‍යාපනයට යොමුවන්නේද ස්වේච්ඡතාවය සහිත පුද්ගලයන්ගෙන් සුළු පිරිසක් පමණකි.

- අධ්‍යාපනයේ දී ස්වේච්ඡතාවය වඩාත් වැරදි ලෙස තේරුම් ගැනීමට ඉඩ ඇත. ඉගෙනීමේ නොහැකියාවක් හෝ මානසික සෞඛ්‍ය ගැටලුවක් හෝ රෝගයක් ලෙස පටලවා ගැනීමට ඉඩ ඇත.

- කෙසේ වෙතත්, දියුණු පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල් විසින් සෙසු රටවලට ස්වේච්ඡතාවය පිළිබඳ දේශන පැවැත්වීමෙන් ප්‍රගතියක් ඇතිවේ යැයි සිතීම වැරදිය. පොදුරාජ්‍ය මණ්ඩලීය සංස්කෘතීන් විසින් ස්වේච්ඡතාවය පිළිබඳව දරණ මතයන් හි වෙනස් කම් වටහා ගැනීමට පූර්ණ සංවාදයක් අවශ්‍ය වේ.

පරිගණක පිටු සැකසුම : රුක්ෂාන් ගුණසේන (එනේබ්ල් ලංකා පදනම)

ENABLE LANKA
FOUNDATION

**එනේබ්ල් ලංකා පදනම**

"සුපිපි", දම්බොක්ක, බෝයගනේ, කුරුණෑගල, ශ්‍රී ලංකා.

දුරකථන:+94 766006404 / +94 772578989

ඊ මේල් : enablelankafoundation@gmail.com වෙබ්:www.enablelanka.org

ISBN 978 – 955 – 3632 – 00 - 5

9 789553 632005